## අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 2022

## 50 - නාට්‍ය හා රංගකලාව

## ලකුණු බෙදීයාම

I පත්‍රය

ලකුණු 1 ×40 = 40 කි.

II පත්‍රය

II පත්‍රය ප්‍රශ්න 07 කි. 01 වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතිරි ප්‍රශ්න 06 යෙන් 04 ක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

01 ප්‍රශ්නයට ලකුණු 12 කි.

- තෝරාගන්නා ඉතිරි ප්‍රශ්න 04 කට ලකුණු 12 × 04 = 48කි.

02 ප්‍රශ්නයට ලකුණු 12 කි.
03 ප්‍රශ්නයට ලකුණු 12 කි.
04 ප්‍රශ්නයට ලකුණු 12 කි.
05 ප්‍රශ්නයට ලකුණු 12 කි.
06 ප්‍රශ්නයට ලකුණු 12 කි.
07 ප්‍රශ්නයට ලකුණු 12 කි.

} ඕනෑ ම ප්‍රශ්න 04 ට ලකුණු 48 කි.

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | 40 |
| II පත්‍රයට ලකුණු | 60 |
| මුළු ලකුණු | 100 |

**විෂය අංකය - 50** **විෂයය - නාට්‍ය හා රංග කලාව**

**අ.පො.ස (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 01**

**I පත්‍රය - පිළිතුරු**

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | **02** | 11. | **02** | 21. | **01** | 31. | **03** |
| 02. | **03** | 12. | **01** | 22. | **03** | 32. | **02** |
| 03. | **02** | 13. | **03** | 23. | **02** | 33. | **04** |
| 04. | **04** | 14. | **02** | 24. | **01** | 34. | **02** |
| 05. | **01** | 15. | **04** | 25. | **04** | 35. | **01** |
| 06. | **01** | 16. | **03** | 26. | **01** | 36. | **03** |
| 07. | **02** | 17. | **01** | 27. | **03** | 37. | **02** |
| 08. | **01** | 18. | **04** | 28. | **02** | 38. | **04** |
| 09. | **03** | 19. | **02** | 29. | **01** | 39. | **03** |
| 10. | **04** | 20. | **04** | 30. | **04** | 40. | **01** |

**විෂය අංකය - 50** **විෂයය - නාට්‍ය හා රංග කලාව**

**අ.පො.ස (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 01**

**II පත්‍රය - පිළිතුරු**

01.

I. කාලිංග, සිරිමල් එතනා, හරිස්චන්ද්‍ර, සාලිය අශෝක මාලා, විදුර, රාමායණය (ලකුණු 02 )

II. ගංගාව නිරූපණය කිරීම සඳහා නිල් පැහැති ආලෝක ධාරාවක් යොදා ගැනීම (ලකුණු 02 )

III. පොතේ ගුරු පූර්ණ විරිඳුව ගායනා කිරීම, පූර්ව රංගයේ දී බහුබූත කෝලමා පැමිණීම, පොතේගුරු විසින් චරිත හඳුන්වා දීම, මංගලම් ගීතයෙන් නාට්‍ය අවසන් වීම... ආදී කරුණු දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02 )

IV. 1975 ජනවාරි 26 ලුම්බිණි රඟහල (ලකුණු 02 )

V. රිචඩ් මානමුදලි, උදේනි චන්ද්‍රසිරි, සමන් ගුණසිංහ (ලකුණු 02 )

VI. දික්පිටියා (ලකුණු 02)

02. (I) නාට්‍යයෙහි දැකිය හැකි සංචලන පදනම් කරගෙන නළු නිළි චලනයන් තර්කානුකූලවත්, තාලාන්විත හෝ රිද්මයානුකූලවත් ගොනු කරමින් ද ආනුෂංගික කලාවන් ඊට සංයෝජනය කරමින් නිර්මාණය කරනු ලබන වේදිකා චිත්‍රය රංග වින්‍යාසයයි.

(ලකුණු 02 )

(ii) ජෙරොම් ලක්ෂ්මන් ද සිල්වා, රුවන්ති. ඩී. චිකේරා . (ලකුණු 04 )

(iii)
- ❖ වේදිකාවේ භූගෝලීය පිහිටීම
- ❖ වේදිකාවේ සමබරතාව
- ❖ ප්‍රබල අර්ථයක් හා දෘශ්‍ය රූපයක් මවා පෑම
- ❖ ආනුෂංගික කලා පිළිබඳ
- ❖ නාට්‍ය ශෛලිය

❖ චලන වර්ග හා හැඩතල ආදි කරුණු තුනක් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 06)

03. (I) ප්‍රේක්ෂක හෝ ශ්‍රාවක පිරිසක් ඉදිරියේ ගායනය , රංගනය, චලනය පදනම් කරගෙන ශිල්පියාගේ පෞරුෂය මැනැවින් හසුරුවා ගනිමින් රංග භූමියක සජීවීව සිදු කරන නිරූපණ කලාවයි. (ලකුණු 02)

(ii) සජීවී බව, සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර, අභිනය භාවිතය,සක්‍රිය ප්‍රේක්ෂක සහභාගිත්වය, නිශ්චිත කාල සීමාවක් තිබීම ආදි .....කරුණු හතරක් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 04)

(iii) ඔපෙරා නාට්‍යයෙහි ඉහත සඳහන් කළ ලක්ෂණ හඳුන්වා දෙමින් කරුණු තුනක් පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 06 )

04. (I) රට යකුම / රිද්දි යාගය (ලකුණු 02)

(ii) දොළහා පෙළපාලිය/ නානුමුරය, කපු යක්කාරිය, දරු නැලවිල්ල (ලකුණු 04)

(iii) අනුකරණය , සමාරෝපය, සංවාද භාවිතය, රංග භාණ්ඩ භාවිතය, අභින භාවිතය, ආදි නාට්‍යමය ලක්ෂණ ඇසුරෙන් පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 06)

05. (I) සෑම අතින් ම සංක්ෂිප්ත වූ , රංග කාලය හා සිදුවීමට ගත වන කාලය කෙටි ඒකාංක නාට්‍ය වේ.

(ලකුණු 02 )

(ii) මංගල සේනානායක, ධනංජය කරුණාරත්න, ඉන්දික පර්ඩිනැන්ඩු , සංජීව උපේන්ද්‍ර (ලකුණු 04 )

(iii) ඒකාංක බව, හරවත් තනි දර්ශනයක් පැවතීම, මිනිස් සිතෙහි ඇතිවන ගැඹුරු හා අපූරු ස්වභාවයන් එළිපෙහෙළි කිරීම, සීමිත චරිත සංඛ්‍යාවක් පැවතිම, අඩු වියදමකින් ප්‍රදර්ශනය කළ හැකි වීම, ස්වතන්ත්‍ර බව, කෙටි බව, ආකර්ෂණීය රූපණය.,කාලය හා රංග අවකාශයේ ඒකීය බව,සරල වේදිකාවක් තුළ වේදිකාගත කළ හැකි වීම ආදි කරුණු තුනක් පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න

(ලකුණු 06 )

06. (I) සුබ සහ යස - සයිමන් නවගත්තේගම/ කැලණි පාළම - ආර්. ආර්. සමරකෝන් (ලකුණු 02 )

(ii) සයිමන් නවගත්තේගම - ගංගාවක්, සපත්තු කබලක් සහ මරණය

ගගන සරන කුරුල්ලෝ, පුස්ලෝඩං, සුදු සහ කළු, පණ්ඩුකාභය

ආර්. ආර්. සමරකෝන් - ලෙඩක් නැති ලෙඩෙක්, අහසින් වැටුණු මිනිස්සු, චරිත දෙකක්, ගමනක්,

ජේලර් උන්නැහේ, කපුටුබෝ, දූවිලි, රජ කතාව

(ලකුණු 04 )

(iii) **සයිමන් නවගත්තේගම -**

- නාට්‍ය රචකයෙක්, අධ්‍යක්ෂකවරයෙක්, නළුවෙක් මෙන් ම,
- ප්‍රකට නවකතා කෙටිකතා කරුවෙක් බව, චිත්‍රපට නළුවෙක් ද වන බවත්,
- සුබ සහ යස නාට්‍ය කෘතිය ලංකාවේ බිහි වූ විශිෂ්ට නාට්‍යයක් වන අතර අතිශයින් ජනප්‍රිය වූ බව, එයින් මහවංශයේ කතා පුවතකින් සමාජ දේශපාලනය විවරණය කරන කෘතියක් බවත්, එහි යසගේ චරිත රඟපන ලද්දේ සයිමන් නවගත්තේගම බව,
- ඉහත දෙවන පිළිතුරෙහි ඇති නාට්‍ය නිර්මාණ සඳහන් කර ඒවායේ තේමා සාකච්ඡා කර තිබීම.

**ආර්. ආර්. සමරකෝන් -**

- ලෙඩක් නැති ලෙඩෙක් නාට්‍යය නිර්මාණය කරමින් නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වූ බව,
- ලෝක ධර්මී සම්ප්‍රදාය ප්‍රධාන වශයෙන් යොදාගත් සුවිශේෂී නාට්‍යකරුවෙක් බව,
- පීඩිත පන්තියේ දැවෙන ප්‍රශ්න වේදිකාවට ගෙනා නාට්‍යකරුවෙක් බව,
- නාට්‍යය සඳහා සංගීතය අත්‍යාවශ්‍ය ම අංගයක් ලෙස යොදා නොගත් නාට්‍යකරුවෙක්,
- සමාජ ආර්ථික, දේශපාලනික ප්‍රස්තුත පිළිබඳ අවධානය යොමු කළ නිර්මාණකරුවෙක්,
- ඉහත දෙවන පිළිතුරෙහි ඇති නාට්‍ය නිර්මාණ සඳහන් කර ඒවායේ තේමා සාකච්ඡා කර තිබීම.

ඉහත විස්තර සහිතව පිළිතුර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

07) ප්‍රශ්නයට අදාළව පසුබිම, කාලය හා චරිත ගොඩනගමින් රංග විධාන හා සංවාද සහිතව චරිත අතර ගැටුමක් මතු වන අයුරින් දෙගිඩියාව කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා ගොඩනගා තිබීම අපේක්ෂා කෙරේ. ඒ අනුව,

(I) රංග විධාන සහිත සංවාද ගොඩනගා තිබීම (ලකුණු 04 )

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙළ සකස් කිරීම (ලකුණු 04 )

(iii) දෙගිඩියාව කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කර තිබීම (ලකුණු 04)

ප්‍රශ්න 2 සිට 6 දක්වා පිළිතුරු සැපයීමේ දී iii කොටසට සම්පූර්ණ ලකුණු ලබා දීමට නම් අවම වශයෙන් කරුණු තුනක්වත් විස්තර කිරීම අපේක්ෂා කෙරේ.

*****